

# අමෙරිකා නියෝජ්‍ය සහකාර ලේකම් මිලින්ද මොරගොඩ හමුවෙයි

බෙංගාල බොක්ක මුහුදු කලාපය ආවරණය කරන අමෙරිකානු වැඩසටහන අනුව මෙම වසර තුළ ශ්‍රී ලංකාවේ සමුද්‍රාරක්ෂක සහ නාවික කටයුතු ප්‍රවර්ධනය උදෙසා අමෙරිකානු ඩොලර් මිලියන 36 ක ආධාර රටට හිමිවනු ඇත. ඉන්දු පැසිපික් සාගරයේ පැවැත්ම උදෙසා ශ්‍රී ලංකාවේ දර්ශනය පැහැදිලි කරගැනීම අරමුණු කරගෙන පාත්ෆයින්ඩර් ආයතනය සංවිධානය කළ සාකච්ඡා වාරයකදී අමෙරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය සහකාර ලේකම් (වැඩබලන) තෝමස් ජේ. වඩා ඒ බව අනාවරණය කළේය.

කෙටි සංචාරයක් සඳහා පසුගියදා දිවයිනට පැමිණි හෙතෙම පාත්ෆයින්ඩර් ආයතනය කොළඹ දී සංවිධානය කළ සාකච්ඡාවට සහභාගී වෙමින් ශ්‍රී ලංකා අමෙරිකා ද්වි පාර්ශවික සබඳතා ගැන අවධානය යොමු කළ අතර ඉන්දු පැසිපික් කලාපයේ සාමකාමී ස්වභාවය උදෙසා දෙරට සහයෝගීතාවය ඉතාමත් වැදගත් බව ද කියා සිටියේය. සැසිවාරයට කලින් නියෝජ්‍ය සහකාර ලේකම්වරයා පාත්ෆයින්ඩර් පදනමේ නිර්මාතෘ මිලින්ද මොරගොඩ මහතා මුණ ගැසුණ අවස්ථාව ඡායාරූපයේ දැක්වේ. අමෙරිකානු තානාපතිනි අලීනා බී. ටෙප්ලිට්ස්, දේශපාලන අංශ නියෝජ්‍ය ප්‍රධානී මාර්කස් කාපෙන්ටර්, මාධ්‍ය නිලධාරිනී නැන්සි වැන්හෝන්, පාත්ෆන්ඩර් සභාපති බර්නාඩ් ගුණතිලක, විධායක අධ්‍යක්ෂ ලක්ෂ්මන් සිරිවර්ධන, අධ්‍යක්ෂ, අද්මිරාල් ජයනාත් කොළඹගේ යන මහත්වරු එම අවස්ථාවට සහභාගී වූහ.